# දැන්වීමයි

## දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම - 2021

දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013.12.13 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළවූ ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කොන්දේසි මෙම බඳවා ගැනීම සඳහා බල පවත්වනු ලැබේ.

සුදුසුකම් :-

- ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියේ වසර 03ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කල නිලධාරියකු වීම.
- පශු වෛද්‍ය විද්‍යා උපාධියක් සහිත විය යුතුය.

**අයදුම්පත්‍ර යොමු කල යුතු ක්‍රමය :**

මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව ඒ 4 (සෙ.මී.21xසෙ.මී.29) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කර අයදුම් පත්‍ර සකස් කර ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2021.04.30 දින හෝ ඊට පෙර ලේකම්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 6 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, ගාල්ල ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම - 2021"** යන්න සඳහන් කරන්න. අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම්පත් එවිය යුතුය.

නියමිත ආකෘතියට අනුකූල නොවන, නියමිත සුදුසුකම් සපුරා නොමැති, අසම්පූර්ණ අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම පුවත්පත් නිවේදනයේ සඳහන් පොදු නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**ගාමිණී වීරවික්‍රම**
ලේකම්
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
6 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
ගාල්ල.

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි කිසිදු වගකීමක් දරනු නොලැබේ.)

### දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම - 2021

1. 1.1. මුලකුරු සමඟ නම :
   1.2. සම්පූර්ණ නම :
   1.3. ජාතික හැඳුනුම්පත් අංකය :

2. 2.1. පුද්ගලික ලිපිනය :
   2.2. රාජකාරි ලිපිනය :
   2.3. ජංගම දුරකථන අංකය :
   2.4. රාජකාරි දුරකථන අංකය :

3. 3.1. උපන්දිනය :
   3.2. 2021.04.30 දිනට වයස :

4. 4.1. වර්තමාන තනතුර :
   4.2. සේවය :
   4.3. රාජ්‍ය සේවයේ මුල් පත්වීමේ දිනය :
   4.4. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයට පත්වූ දිනය :
   4.5. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ 1 ශ්‍රේණියට පත් වූ දිනය :
   4.6 2021.04.30 දිනට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා කාලය :
   4.7 2021.04.30 දිනට රාජ්‍ය සේවයේ සේවා කාලය :
   4.8. පළාත් රාජ්‍ය සේවයේ මුළු සේවා කාලය :

5. 5.1. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ දරණ ලද තනතුරු

| තනතුර | කාල පරාසය |
|---|---|
| ............ | .................... |
| ............ | .................... |

6. 6.1. අධ්‍යාපන සුදුසුකම් :

7. 7.1. සුදුසුකම් හා පළපුරුද්ද :
   7.2. විශේෂ සුදුසුකම් :

8. සහතිකය
   I. මා විසින් සපයා ඇති ඉහත තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්,
   II. උක්ත තනතුර සඳහා මා තෝරා ගනු ලැබුවහොත් මාගේ උපරිම ශක්තිය හා කැපවීමකින් යුතුව සේවය කිරීමට එකඟ වන බවත්, ප්‍රකාශ කරමි.

දිනය............... අත්සන...........................

9. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය:

ඉහත සඳහන් තනතුරට අයදුම් කර ඇති .............................................................මයා/ මිය /මෙය විසින් සපයා ඇති ඉහත තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, ඔහු/ ඇය සම්බන්ධයෙන් විනය හා විගණන විමසුම් මේ වන විට නොපවතින බවත් ඉදිරියට ගැනීමට අපේක්ෂා නොකරන බවත් සඳහන් කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/නිර්දේශ නොකරමි. තවද මෙම සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව ඔහු/ ඇය දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ ඇය දැනට දරණ තනතුරෙන් මුදාහැරීමට එකඟ වෙමි/ එකඟ නොවෙමි.

දිනය ................................. ...........................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව